www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දැවැන්ත දොට්ට දැමීම් පැටවීමේ ඉලක්කය ඇතිව ශ්‍රී ලංකාන්ඩුව ත්‍රෛපාක්ෂික කම්කරු සභාව යලි ක්‍රියාත්මක කරයි

## Sri Lankan government reactivates tripartite labour council to impose mass sackings

ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි
2009 ජූලි 11

ලෝක ආර්ථික පසුබෑසීමේ බලපෑම යටතේ ශ්‍රී ලාංකික කම්කරුවන් දහස් ගනනකගේ රැකියා අහිමි වෙද්දී දැවැන්ත දොට්ට දැමීම් ද කම්කරුවන්ගේ අයිතීන්ට එරෙහි ප්‍රහාර ද පැටවීමෙහි ලා වෘත්තීය සමිතිවලට ප්‍රධාන කාර්ය භාරයක් පවරා දෙමින් ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව ජාතික කම්කරු උපදේශක සභාව (එන්එල්ඒසී) යලි පිහිටුවා ඇත.

පෙර දී කම්කරුවන් බිය ගැන්වීම සඳහාත් තමන්ගේ ඉල්ලීම් අත හැරීමට ඔවුන්ට බල කිරීම සඳහාත් රාජපක්ෂ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය යොදා ගත්තේ ය. එල්ටීටීඊයේ මිලිටරි පරාජයත් සමග "යුද්ධය වෙනුවෙන් කැප වීමේ" එම කාල පරිච්ඡේදය අවසානයකට පත් වී ඇති අතර ආන්ඩුව "ජාතිය ගොඩ නැගීම" ඉලක්ක කොට ගත් නව "යුද්ධයක්" ප්‍රකාශයට පත් කොට ඇත. කම්කරු ඇමතිවරයා හෝ ඔහුගේ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මුලසුන දරනු ලබන මාසිකව රැස් වීමට නියමිත කම්කරු උපදේශක සභාව යලි ක්‍රියාත්මක කර ඇත්තේ ඒ නිසා ය.

ශ්‍රී ලංකාව ගෝලීය ආර්ථික අර්බුදයේ බලපෑමට ලක්ව නැති බවට ආන්ඩුවත් මහ බැංකුවත් දොඩන පුරසාරම් තිබිය දී ම මෑත වාර්තා පෙන්නුම් කරන්නේ ක්‍රමයෙන් නරක අතට හැරෙමින් පවත්නා තත්ත්වයකි. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව මෙම වසරේ පලමු මාස තුන ඇතුලත කාර්මික අංශයේ රැකියා 96,000ක් ද ඉදි කිරීම් අංශයේ රැකියා 36,000ක්ද අහිමි වී ඇත.

සැප්තැම්බර් සහ මාර්තු අතරතුර කාලයේ දී කම්හල් 220ක් වසා දැමුනු බවත් 70,000කට වැඩි පිරිසකට සිය රැකියා අහිමි වූ බවත් කම්කරු අමාත්‍යාංශය වාර්තා කලේ ය. තවත් දොට්ට දැමීම් සිදු වන බව ස්ථිර ය. අප්‍රේල් මාසයේ දී අපනයන ඉපැයීම් එ.ජ.ඩො. මිලියන 438 දක්වා සියයට 28.2කින් ඇද වැටුනු බව මෑත මහ බැංකු වාර්තාවකින් පැවසින. රබර් සහ රෙදිපිලි හා ඇගලුම් අපනයන අනුපිලිවෙලින් සියයට 36.1කින් සහ සියයට 10.1කින් පහත වැටුනි.

හාම්පුත්තු ද අතිකාල, ප්‍රසාද දීමනා සහ වෙනත් ප්‍රතිලාභ කපා හරිමින් පීඩනයෙහි වැඩි බලපෑම කම්කරුවන් මත පැටවීමට උත්සාහ දරා ඇත. කම්කරු උපදේශක සභාව යනු මේ සියලු කප්පාදු ක්‍රියාවට නැංවීම සඳහා යොදා ගත හැකි මෙවලමකි.

අප්‍රේල් 8 වන දා පැවැත්වුනු උපදේශක සභා රැස්වීමේ දී කම්කරුවෙකුගේ රැකියාව අවසන් කිරීම පිලිබඳ පනතේ (ටීඊඩබ්ලිව්ඒ) කාර්ය පටිපාටි ක්‍රියාත්මක වීම අත්හිටුවනු වස් ආන්ඩුවේ නිලධරයන්, හාම්පුතුන් සහ ප්‍රමුඛ වෘත්තීය සමිති 12ක් අතර "පරිපාලනමය සැලැස්මක්" පිලිබඳ එකගතාවක් ඇති කර ගැනින. එමගින් ඉක්මන් දොට්ට දැමීම් ද වැඩ පැය ගනන අඩු කිරීම් ද පටවන්නට සමාගම්වලට ඉඩ සැලසේ.

යට කී පනත යටතේ, සිය සේවය නතර කිරීමට විරුද්ධත්වය පෑමට කම්කරුවන්ට ඉඩ ලබා දෙමින්, අඩු ගනනේ මාස කිහිපයක් වත් ගත වන නෛතික කාර්ය පටිපාටියක් අනුගමනය කරන්නට කම්කරු කොමසාරිස්වරයාට බල කෙරුනි. අලුත් සැලැස්ම යටතේ සති දෙකක් ඇතුලත තීරනයක් ගන්නා ලෙස කම්කරු කොමසාරිස්වරයාට නියම කරමින් මෙම කාර්ය පටිපාටිය වේගවත් කර තිබේ. එමෙන් ම ඔවුන්ගේ වැටුපෙන් "යම් කොටසක්" ගෙවමින් තුන් මසක කාලයක් දක්වා කම්කරුවන් දොට්ට දැමීමේ හැකියාව සමාගම්වලට ලැබේ.

මෙම සැලැස්මට එකග වූ වෘත්තීය සමිති අතරට ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) අන්තර් සමාගම් සේවක සංගමය (අසසේස), ඇටුවම් බැහැපු මාධ්‍යමිකයෙකු වන බාලා තම්පෝ නායකත්වය දෙන ලංකා වෙලඳ සේවක සංගමය (සීඑම්යූ), එක්සත් ජාතික පක්ෂයේ (එජාප) ජාතික සේවක සංගමය (ජාසේස), වෘත්තීය සමිති සින්ඩිකල්වාදියෙකු වන ඇන්ටන් මාකස් ප්‍රධානත්වය දරන නිදහස් වෙලඳ කලාප සේවක සංගමය (නිවෙකසේස) සහ ප්‍රධාන කොට ම වතු කම්කරුවන් මත පදනම් වන ලංකා කම්කරු කොන්ග්‍රසය (සීඩබ්ලිව්සී) ඇතුලත් වේ.

මැයි 26 වන දා පැවති තවත් රැස්වීමක දී සේවයෙන් පහ කල කම්කරුවන්ට වන්දි ගෙවීමේ ක්‍රම සොයා බැලීම සඳහා ත්‍රෛපාක්ෂික කමිටුවක් පත් කිරීමට උපදේශක සභාව එකඟ විය. සම්මත කර ගත් එක් යෝජනාවක් වූයේ "හිමිකම් නොපෑ" සේවක අර්ථසාධක අරමුදල් (ඊපීඑෆ්) සහ සේවක භාරකාර අරමුදල් (ඊටීඑෆ්) සංචිතවලින් මුදල් ඇද ගැනීම යි. මෙය කම්කරුවන්ට කල යුතු ගෙවීම් සඳහා දැනට මත් වෙන් කර තබා ඇති අරමුදල් ගසා කෑමේ පියවරකි.

කම්කරුවන් අතර පවත්නා අතෘප්තිය මඩිනු පිනිස, " ඉක්මනින් ම" සහන පැකේජයක් කෙටුම්පත් කරන ලෙස රාජපක්ෂ කම්කරු ඇමති අතාවුද සෙනෙවිරත්නට උපදෙස් දී ඇත. කෙසේ වුව ද අමාත්‍යාංශ ලේකම් මඩිහහේවා පවසන පරිදි යෝජිත විරැකියා ප්‍රතිලාභ රක්ෂන යෝජනා ක්‍රමය (යූබීඅයිඑස්) තව මත් "සැකසෙමින්" පවතී.

උපදේශක සභාව තුල ඔහු ඉටු කරන කාර්ය භාරය කුමක් දැයි *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* (ලෝසවෙඅ) විමසූ විට සීඑම්යූ නායක බාලා තම්පෝ කියා සිටියේ තමන් සැලසුම්වලට විරුද්ධ බව යි. දොට්ට දැමීම් පිලිබඳව දැනට පවත්නා වන්දි සූත්‍රය අනුව හාම්පුතුන් ක්‍රියා කල යුතු බව ඔහු කී ය. හේ මෙසේ ද පැවසී යː "හාම්පුතුන් කරන ගෙවීම පිලිගන්න කම්කරුවෝ කැමති නං, එහෙනං ඉතිං ප්‍රශ්නයක් නෑ."

වෙනත් වචනවලින් කිය තොත්, තම්පෝ වන්දි මුදල් ගෙවීම හරහා රැකියා විනාශ කිරීම සඳහා සහාය දීමට කැමැත්තනේ සිටිනාව පමනක් නොවේ. වැඩ කිරීමට ඇති අයිතිය ද ඇතුලු සිය අයිතීන් කැප කිරීමේ මග තෝරා ගත්තේ යැයි කම්කරුවන්ට දොස් නැගීමට ද හේ සූදානමින් සිටී.

සේවය අහිමි වූ කම්කරුවෙකුට ඊනියා වන්දි සූත්‍රය යටතේ ලැබෙන්නේ, මාස 48ක වැටුපක උපරිමයකට යටත්ව, සේවය කල එක් වසරක් සඳහා මාස දෙක හමාරක වැටුපකි. පෞද්ගලික අංශයේ අවම මූලික මාසික වැටුප රුපියල් 8,000කට (එ.ජ.ඩො. 70කට) වඩා අඩු ය.

නිවෙකසේස නායක ඇන්ටන් මාකස්ගේ ප්‍රතිචාරය ද මීට සමාන විය. "ඔව්, පරිපාලන සැලැස්මක් තියෙනවා. ඒත් අපි කම්කරු නීති වෙනස් කරනවට විරුද්ධ වුනා" ඔහු ලෝසවෙඅට පැවසී ය. "ඒ නිසා නීති තියෙනවා. තමන්ගෙ සේවය අහිමි වෙනව නං කම්කරුවන්ට දොට්ට දැමීම්වලට විරුද්ධ වෙලා වන්දි ගන්න පුලුවං."

ජවිපෙට අනුබද්ධ අසසේස විශේෂයෙන් ම දුෂ්ට කාර්ය භාරයක් ඉටු කරයි. ඔවුන්ගේ *රතු ලංකා* පුවත්පතට අනුව "කම්කරු අයිතීන් සම්බන්ධයෙන් ආන්ඩුවට බලපෑම් දැමීමේ" ඉලක්කය ඇතිව එය රැකියා අහිමි වූවන් සඳහා ජාතික මධ්‍යස්ථානයක් (එන්සීජේඑල්) පිහිටුවා ඇත.

එන්සීජේඑල් කැඳවුම්කරු ද අසසේස නායකයා ද වන වසන්ත සමරසිංහ *ලෝසවෙඅ*ට මෙසේ කියා සිටියේ යː "රැකියා අහිමි වූවන්ට සහන සපයන්න ආන්ඩුව මැදිහත් වේවි ය කියල අපි බලාපොරොත්තු වෙනවා. අපි කම්කරු ඇමතිවරයාගෙන්, භාන්ඩාගාරයෙන් ඒ වගේ ම මහ බැංකුවෙන් ඒක ලිඛිතව ඉල්ලල තියෙන්නෙ. ආන්ඩුව එහෙම කරන්න අසමත් උනොත් අරගලයක් සංවිධානය කරන එක ගැන හිතන්න අපට සිද්ධ වෙනවා."

අනාගතයේ දී අරගලයක් සංවිධානය කිරීම පිලිබඳ සමරසිංහගේ කතාව කම්කරුවන් රැවටීම සඳහා සැලසුම් කෙරුනකි. දෙමල සුලුතරයට එරෙහිව රාජපක්ෂ ගෙන ගිය වර්ගවාදී යුද්ධයට සම්පූර්න සහාය දෙන ගමන් ජවිපෙ, ලංකා විදුලිබල මන්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට එරෙහි විදුලිබල කම්කරු සටන ද දුම්රිය කම්කරුවන්ගේ වැටුප් අරගලය ද ඇතුලු, මෑත කාලීනව පැන නැගුනු  බොහෝ කම්කරු අරගල දැනුවත්ව නිෂ්ක්‍රිය කලේ ය.

ජාතික කම්කරු උපදේශක සභාව යනු සංගතවාදී යන්ත්‍රනයකි. එය මුල් වරට නිර්දේශ කලේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (අයිඑල්ඕ) යි. ඒ 1976 ජූනි මාසයේ එය පැවැත්වූ ත්‍රෛපාක්ෂික උපදෙස් විමසීමේ (ජාත්‍යන්තර කම්කරු ප්‍රමිති) සම්මේලනයේ දී යි. අයිඑල්ඕව කම්කරුවන්ගේ සමාජීය සහ ආර්ථික ඉල්ලීම් මැඩීමට සහාය වීම උදෙසා තෝරා ගත් වෘත්තීය සමිති නායකයන්ට පුහුනුව සපයයි.

1980 ගනන්වල දී සහ 1990 ගනන්වල දී බොහෝ රටවල් එවැනි ත්‍රෛපාක්ෂික ආන්ඩු-සේවා යෝජක-වෘත්තීය සමිති යන්ත්‍රනයන් පිහිටුවූහ. ඒ තම රටවල ආර්ථිකයන් ගෝලීයකරනය වූ නිෂ්පාදන පද්ධතියට ඒකාග්‍ර කිරීමට ආන්ඩු ගත් පියවර නිසා රැකියා සහ සේවා කොන්දේසිවලට එල්ල වුනු ප්‍රහාරවලට එරෙහිව පැන නැගි කම්කරු පන්ති අරගල හා පොර බැඳීමට යි.

ශ්‍රී ලංකාවේ දී ජාතික කම්කරු උපදේශක සභාව පලමු වරට හඳුන්වා දෙනු ලැබුවේ, දැවැන්ත දේශපාලන අර්බුදයක් පවතින තතු තුල දක්ෂිනාංශික එජාප ජනාධිපති ආර්. ප්‍රේමදාස විසින් 1989 දී ය. රටේ උතුරේ දී සහ නැගෙනහිර දී 1987 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ සිදු වූ ඉන්දියානු මිලිටරිමය මැදිහත් වීමට මහජනයා ප්‍රතිරෝධය පෑහ. ජවිපෙ කර ගෙන ගිය ෆැසිස්ට්වාදී-ස්වෝත්තමවාදී ප්‍රහාර නිසා දිවයිනේ දකුනු ප්‍රදේශය අස්ථාවර විය. ආන්ඩුව තරුනයන්ට එරෙහිව රට පුරා භීෂන ව්‍යාපාරයක් මුදා හරින අතරතුරේ කම්කරු පන්ති

අරගල මැඩ ලීම සඳහා කම්කරු උපදේශක සභාවට එක් වන ලෙස පාලක ප්‍රභූව සමිති නායකයන්ගෙන් ඉල්ලා සිටියේ ය.

1990 ගනන් මුල වන විට තත්ත්වය පාලනය කර ගැනුනු කල්හි උපදේශක සභාව අත් හැර දමනු ලැබින. අනතුරුව බලයට ආ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ සන්ධාන ආන්ඩුව කාලයේ දී වෘත්තීය සමිති මත ඒ වන විටත් යම් පාලනයක් තිබූ පැරනි වමේ දේශපාලන පක්ෂ ආන්ඩුවේ කොටසක්ව සිටි නිසා උපදේශක සභාව අවශ්‍ය නොවින.

කම්කරු උපදේශක සභාව යලි ක්‍රියාත්මක කිරීමෙන් සංඥා කෙරෙන්නේ කම්කරු පන්තිය හමුවේ දැවැන්ත අනතුරු මතු වෙමින් පවතින බව යි. හිස සිට දෙපතුල දක්වා ම ධනවාදී ලාභ ගැරීමේ ක්‍රමයටත් ජාතික රාජ්‍යයටත් ගැට ගැසී සිටින ප්‍රතිගාමී සමිති නායකයන් යටතේ රැකියා, සේවා කොන්දේසි හෝ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කර ගැනීමට කම්කරුවන්ට නොහැකි ය.

වෘත්තීය සමිතිවල පොලිස්කාරකම යටතේ ක්‍රියාවට දැමෙන දොට්ට දැමීම්වලට සහ අනෙකුත් ප්‍රහාරයන්ට එරෙහි සටන මතු කරන්නේ සංගත ප්‍රභූව ද එහි කම්කරු ආවතේවකාරයන් ද සැම රටක දී ම රැකියාවලට සහ මූලික අයිතීන්ට එල්ල කරන දැවැන්ත ප්‍රහාරයට එරෙහි වූ කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුකම පන්නර ගැන්වීම මත පාදක වන සමාජවාදී ඉදිරි දර්ශනයකින් මෙහෙයවෙන තීරනාත්මක දේශපාලන අරගලයක අවශ්‍යතාව යි.